
# නිර්මාණ Nirmana

## ඇය ඔහුට ලියූ කවි - 2
## Poetry she wrote to him



සඳුන් සුවඳ තැවරුණු එක සුසුමක ට
කිරි සුදු මලක් පිපුණයි මා යහන පිට
එ සඳුන් සුවඳ සිපගන්නට හදන විට
එය සිහිනයක් බව පෙනුණා දුකයි මට

සෙනෙහෙ සිතින් මගෙ සිත ගිය මුත් නුඹට
අන් සතු උයනෙ පිපි මලකැයි කීය මට
සුරඟන ඇවිත් මල් නෙලුවත් උයන් වට
කලින් එන්න දිව රථයක් නොදුනි මට

පැතුම් පුරා පෙර සසරේ පුරුද්ද ට
ඔබ හමුවුණේ පූරුවෙ මා කළ පින ට
පින් මදි වුණේ කිම නොදනිමි වැරැද්ද ට
පැතූ ලෙසට ඔබ හිමිවුණි පිනැත්ති ට

දෙදෙනා බැගින් ඔය එක ඉත්තේ වසන
තුඩ තුඩ තබා ආදර පෙම්බස් දොඩන
විහඟුනි මෙයයි පැන මා පිළිතුරු සොයන
සසරේ මතුත් තනිකම පමණද සරණ

කවි සිතුවිල්ල සෙනෙහසකින් උපන්නේ
හැම කවියක්ම ඔබ වෙනුවෙනි ගැයෙන්නේ
මෙතරම් දුකක් ඇයි සිතකට දැනෙන්නේ
ඔබ සොය සොයා ඇයි මගෙ සිත දුවන්නේ

(අඥාතයි) Anon - x x x

## බුදු හිත

බුදු හිත ලොව දකින නිම් හිම් නැති මිහිර
සනාතනයි නොදිරයි වෙනතර අමර
සසරම වසා ඇති මහ දුක් කඳ අතර
බුදු හිතකට පෙනේ ඒ ඉමිහිර නිතර

බුදුවරු නිදුක් සුව නිබඳම වළඳන් නේ
අජරාමර මිහිර නිරතුරු දකිමින් නේ
නැති විට දුකක් බුදු සිත්වල උපදින් නේ
මිහිරක් මිසක වෙන මොනවද හමුවන් නේ

නොවිඳින මිහිරක්ය බුදු හිත්වල ඇත්තේ
දුක සැප නැතිකමයි පදනම ඒ තත්තේ
ඒකයි කිසිදු වින්දනයක් එහි නැත්තේ
සුවයක් පරම ඇත ඒ හිස්බව මත්තේ

වින්දනයක් නැතිව දනෙනා දෙය දනෙන
අනුවේදනය පමණක් හැම විට තිබෙන
දනෙනා කිසිම දෙයකින් කම්පා නොවෙන
නිසසල නිහඬ හිතමය ලොවුතුරු නිවන

නොහිතන හිතක කෙලෙසුන්ගේ කහට නැත
පිරිසුදුකම නිසා පැහැදිලි ගතිය ඇත
නිම් හිම් නොමැති ඒ පැහැදිලි ගතිය මත
අජරාමරවූ සුවයක් ඇත සියලු අත

අනුවේදන වෙතත් ලොව පවතින නිමිති
සුබ දුක් වේදනා කිසි විටකදී නොමැති
අවෙදයිත සුවයක් නිරතුරු පවති
බුදු වූ සිතැත්තෝ පමණක් එය දනිති

♦ මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම
Harrow UK

## අම්මා

ඔබෙ කුස හිඳින්නට පළමුව දුන් ඉඩය
දින දින වැඩුණු මා බර ඉසිලුයෙ ඔබය
ගජමුතු රකින සේ රැකුණේ දරු ගැබය
මෙලොවට බිහි කළේ විඳිමින් දහ දුකය

රිසිසේ නිදන්නට කන්නට බොන්න පවා
ගත් දැඩි අසීරුව දසමස වෙහෙස නිවා
සෙනෙහස දිදී මා සැදුයේ කවා පොවා
ලස්සන කරන්නයි මගෙ ලොව සිහින මවා

ජීවිත දිනන්නට ඇති බාධක බැම්මේ
නැණ ගුණ දෙවා නෙතු පහදා බිඳ දැම්මේ
ගැයුවත් කොතෙක් නුඹෙ ගුණ කඳ නැත නිම්මේ
මගෙ සිත් අහස පැයූ හිරු සඳු අම්මේ

කුසගිනි දරා නෙතු කඳුලැල් සහව මින
මා කුස පිරෙව්වා තිබු හොඳ දේම ගෙන
සිටිනා මහමෙරක් සේ දුක් උහුල ගෙන
උදයේ හවස මම ගයනෙමි ඔබගෙ ගුණ

♦ විමලා යාපා - සයිප්‍රස් (Cyprus)

## වෙන්ව් ගිය මිතුරියට

පාසැල් වියේ සිට මා හා මිතුරු වෙලා
ඇවිදින් බොහෝ දුර මගෙ සෙවනැල්ල වෙලා
නොසිතුව පරිදි ඔබ දිවිමග නතර කළා
කෙලෙසක හිත හදාගන්නද සිටිමි බලා

පිපි හැම මලක් පරවී යන නමුදු ලොවේ
එය පිළිගැනීමට කිසිවෙකු කැමති නොවේ
පවතින දහම එය නම් මේ මිනිස් ලොවේ
එදහම ඉදිරියෙහි අප සැම අසරණ වේ

ඔබගේ පවුලෙ අය සහ නෑසියන් හැම
අතහැර දමා ඔබ ගිය බව දනිමි මම
මාගෙම සොයුරියක් වී හැම බවය කම
ඉපදේවා! කියා සෙනෙහෙන් පතමි මම

ඔබෙ කරුණාව සහ දැක්වූ ළබැඳි කම
හැම මොහොතකම අදරින් සිහිකරමි මම
සිත තිබු සොයුරු දහමෙහි නොපෙනෙනා ඉම
හදවත පතුලෙ ඇත ඇත්තයි සදහ ටම

දැඟු කාලයක් පැවතුණ අප මිතුරු දම
නැත කිසියම් දිනක අමතක කළේ මම
දරුවන් ඇතුළු ඔබෙ ඒ පොඩි පවුලෙ හැම
දිවි ඇති තුරා ඔබෙ නාමෙන් රකිමි මම

♦ නන්දා අබේසිංහ
පාතේගම - මාතර Sri Lanka

## මගේ මිනිබිරියන්ට !

ආච්චිගේ උකුලෙ ඉඳන්
කවි කියන්න ගී ගයන්න
මගේ රත්තරන් පැටියෝ
නුඹ එනවද ලංකාවට

මුළු ගෙදරම පාළුයි අද
බෝනික්කෝ තනිවීලා
සෙල්ලම් බඩු එකතුවෙලා
නුඹ එනතුරු බලා හිඳී

බෝ මළුවේ වටේ යන්නෙ
අත්තම්මා තනියෙන් අද
හඬනගලා සාදු කියන
මගෙ පැටියෝ නුඹ කොයි වෙද

පුංචි සාරියක් ඇඳගෙන
පොත් මිටියක් අතින් අරන්
ටීචර් වගෙ උගන්වන්න
කවදද සිය රට එන්නේ

සිල්ප සතර උගෙන මනා
රටට දැයට නම්බුකාර
දරුවන් තුන් දෙනෙකු වන්න
එයයි මගේ එකම පැතුම!

♦ සෝමලතා ද සිල්වා
බලපිටිය Sri Lanka

## Fox's blood on a silk scarf

Through woodlands engulfed in thick autumnal mists
Lay the road to the country's annual Hunt-Dance venue.
The hunter, sartorial in elegant dinner-jacket was in ebullient mood
Happy his hounds had earlier that day killed several foxes
Their mangled bodies grotesque trophies of primal blood-lust.

He drove his vintage Bentley cautiously
Suddenly a dull thud - he stopped.
He stooped over the body writhing in its death-throes
A red fox!
At that moment he resolved never to fox-hunt again
Wrapping the body in his white silk scarf.

♦ Denis Jansz London NW8

## බැඳීම



නුඹලා අපගෙයි අප නුඹලාගෙයි
සංසාරේ අප සරන තුරා

ඇහලුම් බරපොදි අරගෙන යද්දී
නුඹෙ ඇස ගැටුණේ නෑ දෝණී
අපෙ ඇස කඳුලින් පිරිලා තිබු වග
ඇතට ඇතට යනවා පැටවුන්
පුරුදු කැදැල්ලෙන් එළියට බැහැලා

කාමර හිස්වී මහගේ ලොකුවී
බිත්ති හතර මැද අප තනිවී
රන් දහඩිය තෙත්වූ ඇඳුමක්වත්
ඉතිරිකරන් අප තුරුළට ගන්නට
දිවිය පුරාවට නුඹ අප හද සේ
එය තුරුළේ රඳවා ගන්නම්

පහේ බස් එකේ කොළඹට යන්නට
සකල කළමනා පටවාගෙන මං
දකිද්දි අවසන් වතාවෙ අම්මා
එවගක් තුන්හිතකින් නොපැතුයෙමි
මගේ මව්පියල් ලබපු වේදනා
රියසක මෙන් පෙරළී ඒයයි මට

මාපිය සරණට වැඩියෙන් සරණක්
නුඹෙ හිමි නුඹහට සදන නිසා
දිනයක නුඹ අප හැරදා යනබව
දැන සිටියෙමු බිහිවුණු දා සිට නුඹ
නුඹටත් මේ දුක දැනේවි දවසක
එදාට අපි හරි ඇතයි දෝණී!
කෙලෙසක වාවන්නද මව්පියවරු
නුඹලගෙ පුසුඹයි නිබඳ දැනෙන්නේ!

♦ අමර ගුණසේකර
France

## සමුදීම

ඇහිලිතුඩු අගින්
ඉස්සී මම
නුඹ සෙව්වෙමි
යන එන
මග නැවතී

දෙඇසම පිරී
කඳුලක් වැටී
නුඹ නැතිබව
දැනුණම
හද සොවිනි

අතැහිලි බැඳී
යළි වෙන්නොවී
හිඳිනට බැරිව
හිත ලතැවුණි
පෙම මියැදුණි
අපි වෙන්වුණි
සැනසෙනු මිසක
පිළියම් නැති.

♦ ඉන්දුමාලි යටවර
Sri Lanka

## වඩිනු මැන මහද කුටියට

උඩු වියන් බැඳ සුදට බබලන
සිනිඳු පිරිවට බිමට අතුරා
සුවඳ මල් වැල් යසට ගලපා
මියුරු වෙණනද අවට පතුරා
සුවඳ දුම් මැද මහද කුටියේ
ලැගුම් ගන්නට නිවී සැනසී
සතුට එනු මැන මහද පුරවා

සැපත එනු මැන අසපුවට හද
බොහෝ ඉඩ ඇත වැතිර ඉන්නට
සුපුදු ඇතිරිලි මලින් වැසිලා
සුවඳවත් මේ සොඳුරු කුටියකි
ඔබයි රැජිණිය ඔටුනු පැළඳූ
වඩිනු මැන මා සුහද අරණට

සුවඳ තෙල් පිරි පහන් එළියෙන්
සුවඳ වත් වූ සුමුදු පවනින්
සැනසි සැනසී සිසිල ලබමින්
වැතිර ඉන්නට මහද කුටියේ
මෛත්‍රිය එනු මැනවි මාවෙත

කරුණාව මුදිතාව සමගින්
එකට පැටලී දෙඅත් වනමින්
වඩිනු මෙහි බිය සැක තුරන්කර
සදා කල්හිම ඔබට විවරයි
මහද කුටියේ සියලු දොරවල්

♦ මධුරි අබේවික්‍රම
Harrow UK



## කුඩා ඇණය

හොඳින් පණ-
පොවන ලද
මිටි හිසකි.
ඇගේ ඇස.

මුල සිටම මම
කුඩා ඇණයක්ම විය

ඒ ඇසින් ලන
තාම ඉඳ හිට
පුංචි පහරක්
වුනත් ඇති මට
කඩා බිඳගෙන
බොහෝ ගැඹුරට
අතීතය විදගෙන
බහින්නට

රුවන් බන්දුජීව
Sri Lanka

## නොපෙනෙන තැන්

ඇත එන වැහි වලාවක් දැක
හිතට සංකා නැගෙයි විගසට
වියැකිලා යන හිතේ සොම්නස
මැදින් දුව එයි මතක සටහන්
රැවටුනාදැයි මෙතෙක් ආ මග
අසන්නෙමි මා මගෙන් නෙකවර

♦ සුසන්තා වික්‍රමසිංහ
බටපොල
Sri Lanka

## අහෝ! දහම් දිවයිනක අද හැටි!

තුන් මසකට ඉහත හිඟනුන් අටක් මරා
ගත් බව පසුම්බියෙ තිබු මුදලක් ද සොරා
පළවිය පුවත්පත්වල ඒ බව ඉඳුරා
මේවා අසන විට හදවත යයි දෙදරා

යාචකයින් පවා අයියෝ! මරණ රට
කොහොමද ඉවසන්නේ මේවා ඇසෙන විට
නීතිය අහෝ පත්වීලද බීති යට
නිසි දඬුවමක් දුන් බව නැත අසන් නට

බුදු බණ කැලේ ගොස් ඇත අප නොසිතු ලෙද
නොදනිති කියාවත් පව් පින් තියෙන වද
පොත්ගුල් තුළෙහි තුන් පිටකය නිදන සඳ
ගුණ දම් කියා දෙන්නට අද කෙනෙක් වෙද

කුල නිල දන බලය නොව ගරු කළ යුත්තේ
ගුණ දහමටයි කෙනෙකුගෙ ගරු කළ යුත්තේ
ඒ හැම දෙයම දැන් කණපිට ගොස් ඇත්තේ
මේ වන් ලොවක අප අසරණ වී ඇත්තේ

♦ එස්. කංකානම්ගේ
කැකණදුර මාතර Sri Lanka

## කොටුව

හැමදාම හවසට
සීයක් දෙසීයක් දැම්මත්,
ඉඳහිට හඳ පැත්තට එබිකම් කළත්,
එක සිල් පදයක් රැකගත්තේ
ඔබේ නමින්
ඒත් දිනක් දෙකක් රෑ වුනොත්
අහනවා ඔබ
රාමා සීතගෙන්
අහපු ප්‍රශ්නය මගෙන් !

♦ ක්‍රිෂාන් රාජපක්ෂ Sri Lanka

## කවිය ඔබ

යන එන විටදි මගතොට මුණගැසුණු විට
නාඳුනනා ලෙසින් වෙනතක් බලන විට
සෙනෙහස පිදුව මා හදවත පතුලෙ සිට
මතුවන දුක මෙතෙකැයි කිව නොහැක මට

පහළොස්වක සඳක් වී නෙත පෑ රහස
නෙතගට රසඳුනක් වී තුට දෙන විලස
දෙතොලට ගලා ආ සිතනා පිය පහස
මතකෙට නොඑනු මැන දුක්බර කවක් ලෙස

♦ මහනුවර - අරවින්දි රණතුංග
සිංගප්පූරුව Singapore

## සමුගැන්මකට පසු

දුකඳුර තුරුළු කර
දෑසග හිරවුණු
කඳුළු සමගින
සමුනොගෙන සමුගතිමි.

දැන් ඉතින්,
අඳුරු කළු තනිකමෙන්
දැවෙන හදවත පුරා
සක්මන් කරමි....

හද පතුලෙහි
නිධන් කෙරූ,
රුවන් මතකයන්
සොයන්නට.
විඳින්නට හිමින් සීරුවේ
එක බැගින් ගෙන.

මිටින් මුදාහළ
කිරිලියක සේ,
පියාඹන තුරු
නැවත සෙවණට

♦ එරංගා පෙරේරා
නෙදර්ලන්තය
Netherlands

## අසමි ඔබෙන් !

අමතකව ගොසින් මතකයන්
ඔබ ගැන සැමදෙනා තුළින්

මොනවා කරන්නද දැන් ඉතින්
හිත හදාගන්නවා මිස
දුක්වෙන්න එපා දුවේ
මේ තමයි ජීවිතේ
එපමණයි ගෙනා ආයුෂ!
පවසයි නෑ හිතමිතුරන්
මා හිස පිරිමදිමින්!

ඉපදීමක් ඇතොත්
මරණය ඒ ළඟම බව
පැවසූ බණපද ඇසේ තවමත්
ඉඳහිට හෙමිහිට

තාත්තේ පොඩි වැඩිද තවම මා
ඇයි වාවනු බැරි මෙදුක
ඇයි නොවැටහෙන්නේ
ලෝදහම ?
මේ යථාර්ථය ?

♦ ලුම්බිනී විතාන
Langley UK